පාලි භාෂාවෙන් කෘත වෛද්‍ය ග්‍රන්ථ

පරසන්ගස්වැව සුමනතිස්ස හිමි

හැඳින්වීම

වෛද්‍ය ශාස්ත්‍රය විද්‍යාවක් ලෙස දියුණු වීමට ප්‍රථම ආගමික මුහුණුවරකින් සමාජ ගතව තුබූ බවට සැකයක් නූපදිනුයේ එය සනාථ කිරීමට අවශ්‍ය සාධක පමණටත් වඩා වත්මනෙහි අප හමුවේ සුළභ හෙයිනි. උක්ත වෛද්‍ය ශාස්ත්‍රයට ආගමික මුහුණුවරක් හෝ ඓතිහාසික වූ අතිරේක අගයක් ලබාදීමට ගත් වෑයමක ඵලයක් ලෙස ආයුර්වේදය හින්දු ආගමික මුහුණුවරකින් වෛදික ග්‍රන්ථ හා සම්බන්ධකොට ඇති අයුරු පැහැදිළිව දක්නට පුළුවන. මහා බ්‍රහ්මයා විසින් ආයුර්වේදය අවබෝධ කරන ලද්දේ ප්‍රජාව මැවීමටත් ප්‍රථමව බව ''සුශ්‍රැතසංහිතාව'' නම් වෛද්‍ය ග්‍රන්ථය පැවසීමෙන් උක්ත ප්‍රකාශය තවදුරටත් තහවුරුවේ.[1] ''විද්'' ධාතුවෙන් නිපන් ''වේද'' යන පදය ''විද්‍යාව, ඥනය, දැනීම'' යනාදී අර්ථ වහනය කරන අතර ''අයුඃ'' යන පදය ''ආයුෂය+'' යන අර්ථය ප්‍රකාශ කරන බව පැහැදිළිය. 'ආයුඃ' යන පදය පූර්වාංගමවී ''වේද'' යන පදය අපරවද යෙදී ''ආයුර්වේද'' ලෙස පද සාධනය වී ඇත. සකු වියරණයට අනුව මෙය සන්ධි පදයකැයිද (ආයුඃ + වේද) කීම නිවැරදිය. ''ආයුර්වේද'' යන වචනය වනාහි දීර්ඝ ඉතිහාසයක් සඟවාගත් පදයකි. මෙම පදය වේද යුගය කරා දිවෙයි. ''චතුර්විධ ආයුෂය පිළිබඳ විද්‍යාව ආයුර්වේදය''[2] යනුයෙන් චර්කසංහිතාව නම් වෛද්‍ය ග්‍රන්ථය සඳහන් කරන්නේ එනිසාය. සංස්කෘත භාෂාව තරම්ම පාලි භාෂාවද පැරණි වූ නමුත් කලකදී සංස්කෘත භාෂාවත් හින්දූන්ගේ නැගිටීමත් සමග පාලි භාෂාව ඉන්දීය සමාජයෙන් වියුක්ත වූ බවක් දැකිය හැකිමුත් බුදුදහම ව්‍යාප්තවූ බොහෝ රටවල පාලි භාෂාව සුරක්ෂා වූ බව සිතිය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස අද දක්වාම පාලි භාෂාව ආරක්ෂා වී ඇති නමුත් පෙර මෙන් සක්‍රීය භාෂාවක් ලෙස පිළිගැනීමට වියත්හු මැලිකමක් දක්වති. සන්දර්භය තුළ බිහිවී ඇති බොහෝ ආගමික ග්‍රන්ථ මෙන්ම නොයෙකුත් ශාස්ත්‍රීය ග්‍රන්ථයන්ගේ භාෂාව සංස්කෘත වීම මීට එක්

හේතුවක් බව සිතීමට තරම් සාධක හමුවේ. පාලි භාෂාවෙන් රචිත කෘති බොහෝ විට සුරැකිව ඇත්තේ ජම්බුද්වීපයෙන් එපිට රටවල බව පැවසීම යුක්තියුත්තය. මෙහිලා අපගේ අවධානය යොමු වන්නේ පාලි භාෂාවෙන් රචිත ග්‍රන්ථ කෙරෙහිය. පාලිය මාධ්‍යය කොටගෙන විවිධ තේමාවන් ඔස්සේ ග්‍රන්ථ රචනා වී තුබුණද මෙහිලා අපගේ විශේෂ අවධානය යෙමුවන්නේ පාලියෙන් රචිත වෛද්‍ය ග්‍රන්ථ පිළිබඳව අධ්‍යයනයනක් කිරීමටය.

පාලි භාෂාව

තතු කෙසේ වෙතත් ඉන්දියන් උපමහත්දීපය වනාහී ලෝකයේ සුවිශේෂි ස්ථානයකැයි පැවසීමට අමුතුවෙන් අටුවාටීකා අවශ්‍යය නොවන්නේ ලොවට දායද කළ සුවිශේෂී මානව චින්තකයික්ද ඔවුන්ගේ එකී චින්තාවන් වර්ධනයද එහිම සිදුවූ නිසාවෙනි. විවිධ භාෂාවන්ගේ උපත සිදුවී ඇති අයුරුද එකී භාෂාවන්ගෙන් නිර්මිත මානව චින්තනය ලේඛනයට පෙරලා වර්තමානය තෙක් සුරක්ෂා කර ඇති අයුරුද වත්මනෙහි අප සියල්ලන්ගේම අවධානයට යොමුවී හමාර නමුත් ඒවා පිළිබඳ නිසි අධ්‍යයනයක් කිරීමට තරම් වත්මනෙහි අප සූදානම්දැයි යන්න විමසීම පවා අතිශය උගහටය. පාලි භාෂාව පිළිබඳ විවිධ උගතුන් දැක්වූ අදහස් කිහිපයක් පහත පරිදි ගොණුකළ හැකිය.

''පාටලී'' යන්නෙන් ''පාලි'' ශබ්දය බිඳී අවකැයි මැක්ස් වැලේසර් (Max Walleser) මහතා පවසයි. විල්ඩර් පඬිතුමාට අනුව පාලිය යනු එවක පොදු මහ ජනතාවගේ භාෂාවයි. ඇතමෙක් පාලිය මගධයෙහි භාෂාව ලෙසද පිළිගනී.[3] පාලිය හෙවත් මගධ*[4] භාෂාව මාධ්‍යය කොටගෙන ලෝක සත්වයා වෙත නව්‍ය වූත් දාර්ශනික වූත් නව දහමක් ලොව්තුරා බුදු පියාණන් වහන්සේ ලෝක සත්වයාට දායාද කළේද මෙම ජම්බුද්වීපයෙහිදී බව අමුතුවෙන් නොකිවුව මනාය. පාලි භාෂවේ උත්පත්තිය පිළිබඳ විවිධ වියතුන් විවිධ මත ප්‍රකාශ කළද පාලිය ඉන්දිය උපමහත්ද්වීපයෙහි උපන් භාෂාවකැයි පිළිගැනීමට සියල්ලෝම පෙළඹෙති.

පාලියෙන් රචිත වෛද්‍ය ග්‍රන්ථ

පාලි භාෂාව වනාහි ථේරවාද ත්‍රිපිටකය රචිත විශ්වීය භාෂාවයැයි නොපැවසිය හැක්කෙක් මිහිපිට වේ යැයි සිතීම පවා උගහටය. පාලි භාෂාව ශ්‍රැති රම්‍ය භාෂාවකැයිද මනෝරම භාෂාවකැයිද අර්ථ දැක්වීමට වියතුන් මෙන්ම භාෂා ශුද්ධිවාදීන්ද පෙළඹෙන්නේ එනිසාය. පාලි භාෂාවේ ස්වභාවය පිළිබඳ සාකච්ඡා කිරීම මෙහි මුඛ්‍ය පරමාර්ථය නොවන හෙයින් ඒ පිළිබඳ අවධානය යොමු නොවන බව පැවසිය යුතුය. පාලි භාෂාව මාධ්‍ය කොටගෙන ග්‍රන්ථ රචනාවීමේ ඓතිහාසික ක්‍රමික වර්ධනයක් දක්නා ලැබේ. බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 440ක් ගතවූ තැන ලක්දිව වළගම්බා රජ දවස[5] පිටක ග්‍රන්ථ රචනා වීමෙන් අනතුරුව අටුවාද අනතුරුව ටීකාද ටිප්පනිද වශයෙන් ක්‍රමිකව සංවර්ධනය වී බුදුදහමින් පරිබාහිර මාතිකාද පදනම්ව පාලියෙන් ග්‍රන්ථ කරණයෙහි යෙදුණු වියතුන් සමූහයක් දක්නට ලැබේ. ඔවුන්ගේ අභිප්‍රායන් අභිලාශයන් කෙසේ වෙතත් පාලි භාෂාවෙන් ග්‍රන්ථ රචනා කිරීම වනාහි භාෂාවක් වශයෙන් පාලියට හිමි ස්ථානය ඉහළට එසවීමකැයි පැවසීම යුක්ති යුත්තය.

බුදුදහමට අනුව ලෝකයේ පවතින සියලුම රෝග දෙයාකාරය. අංගුත්තර නිකායේ රෝග සූත්‍රයෙහි මේ පිළිබඳ විස්තරයක් දක්නට ලැබේ. ඒ අනුව කායික රෝග සහ මනෝ රෝග වශයෙන් ඒවා වර්ග කර ඇත.[6] පෘථග්ජන පුද්ගලයා කායික රෝග වලින් මිදී වර්ෂයක් දෙකක් ආදී වශයෙන් දිවි ඇති තෙක් විසුවද මනසික රෝගවලින් මිදී මොහොතක්වත් විසිය නොහැකි බව උක්ත සූත්‍රයේ වැඩිදුරටත් සඳහන්වේ.[7] බුදු දහම තුළ මනෝ රෝග විශලේෂණයේ අරමුණ නම් මිනිසාට යහපත් මානසික සෞඛ්‍යයකින් යුතුව දෛනික ජීවිතය පවත්වාගෙන යාමට උවදෙස් ලබාදීමත් බුදු දහමේ ඉගැන්වෙන පරම නිෂ්ටාව වන නිර්වානාවබෝධය පිණිස උජුපටිපන්න මාර්ගය පැහැදිලි කිරීමත්ය. නිරෝගීකම, සතුට යන දෙකම ඇති තැන තමා පිළිබඳ සහ අන්‍යයන් පිළිබඳ විශ්වාසය නිරායාසයෙන්ම හටගනී. ලාභයක් බඳුවූ නිරෝගීකමත් ධනයක් බඳුවූ සතුටත් ඤාතිවෙකු බඳුවූ විශ්වාසයත් ඇති තැන පරම සුවය වන නිර්වානාවබෝධය පහසුවේ.[8]

බුදුපියාණන් වහන්සේ වනාහි වෛද්‍ය වරයෙකි. උන්වහන්සේ නිරතුරුවම ''දුක'' නමැති රෝගයට නිසි ඖෂධය සොයාගත් වෙදාණෝය. එනයින් බලන කළ පාලියෙන් රචිත විශිෂ්ටතම වෛද්‍ය ග්‍රන්ථ සමූහ ලෙස පාලි ත්‍රිපිටකය හඳුන්වාදීම නිවැරදිය. බොහෝ වෛද්‍ය ග්‍රන්ථ මෙන් කායික රෝග විනිශ්චයක් සූත්‍ර පිටකයේ ඇතැම් සූත්‍ර තුළද විනය පිටකයේද දක්නට ලැබීම උක්ත ප්‍රකාශය තව දුරටත් තීව්‍ර කරයි. ත්‍රිපිටකයේ නොයෙකුත් තන්හි සඳහන් වෛද්‍ය උපදෙස් ඒකරාශී කිරීමෙන් අගනා වෛද්‍ය ග්‍රන්ථයක් නිර්මාණය වේ.

සිව්පසය වනාහි භික්ෂූන් ප්‍රත්‍යවේක්ෂණයෙන් යුතුව පරිහරණය කළ යුත්තකි. එහිලා අන්තර්ගත ''ගිලානපච්චයභේසපරික්ඛාරය'' වනාහි රෝගාතුර වීමට පූර්වයේ සිට මෙන්ම රෝගාතුර වූ අවස්ථාවන්හිද ප්‍රත්‍යවේක්ෂණයෙන් යුතුව ඖෂධ භාවිතය කළ යුතු බව සිහිගන්වන්නකි. උපසපන් භික්ෂූන් උදෙසා උද්දෙසන ලද සිව් නිස්සයන්ගෙන් එකක් වශයෙන් රෝග නිවාරණයට එළමූත්‍ර භාවිතය අනුදැනීමෙන් සැහැල්ලු දිවිපෙවතක ලක්ෂණ විදහාපායි. විනය මහාවග්ගයෙහි මේ පිළිබඳ විස්තර හමුවේ.[9] භේසජ්ජක්ඛන්ධකය වනාහි භික්ෂූන්ට අනුදැන වදාළ බෙහෙත් පුස්තකයකැයි පැවසීම නිවැරදිය. මීට අමතරව සුත්ත පිටකයෙහි අපට හමුවන කායවිච්ඡන්දික, සල්ල, ගිරිමානන්ද, යනාදියද බොජ්ඣංග සූත්‍රද මෙහිම ගිනියහැකි වෛද්‍ය උපදේශයන්ගෙන් යුකත සූත්‍ර කිහිපයකි. අටුවා ග්‍රන්ථ තුළ විස්තාරිත මෙම භෛසජ්ජ ක්‍රමවේද ඇතැම්විට තේරුම් ගැනීමට පවා අසීරුය.

අටුවා, ටීකා යුගයෙන් පසුව අපට හමුවන පාලියෙන් විරචිත වෛද්‍ය ග්‍රන්ථ පිළිබඳව වියතුන් බොහෝ පර්යේෂණ කළ බවක් ඔවුන්ගේ අත්දැකීම් විස්තර කෙරෙන ග්‍රන්ථයන්හි දක්නට ලැබේ. ''පාලියෙන් ලියවී තිබෙන එකම වෙදපොත භෙසජ්ජමඤ්ජුසාවයි'' යනුවෙන් අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත මහනාහිමියන් පවසයි.[10] ජී. මලලසේකර මහතාද ඔහුගේ ''ශ්‍රී ලංකාවේ පාලි සාහිත්‍යය'' (The Pāli literature of Sri Lank) නම් කෘතියෙහි බුද්ධදත්ත නාහිමියන්ගේ අදහසම දරන බවක් විද්‍යමාන වේ.[11] ජිනදාස ලියනගේ මහතාගේ සංස්කරණයෙන් පාලි මුද්‍රණ සමාගම මගින් මුද්‍රණය කරන ලද භේසජ්ජමඤ්ජුසාවෙහිද (Bhesajjamañjūsā) මෙම අදහසම දක්වා තිබීම[12] මගින් සිතිය හැක්කේ සියලුම වියතුන් පාහේ

භේසජ්ජමඤ්ජුසාව පාලියෙන් විරචිත එකම වෛද්‍ය ග්‍රන්ථය ලෙස පිළිගන්නා බවයි. මේ අනුව මෙහිලා අපගේ අවධානයට ලක්වන්නේ පාලියෙන් විරචිත එකම වෛද්‍ය ග්‍රන්ථය ලෙස සම්භාවනාවට පාත්‍ර වූ භේසජ්ජමඤ්ජුසාව නම් වූ කෘතිය වෙතය. මෙම කෘතිය වනාහි නොවිසඳුණු ප්‍රශ්න රාශයක් නිර්මාණය කරන්නකැයි කීම නිවැරදිය.

භේසජ්ජමඤ්ජුසාවේ කර්තෘ සහ කාලය පිළිබඳ විවිධ වියතුන් සිය මත ඉදිරිපත් කළමුත් එයද නොවිසඳුණු ප්‍රශ්නයකැයි පැවසීම සාධාරණය. මෙහි කතුවරයා පිළිබඳ නිවැරදි නිගමනයක් දක්නට නැතැත් විවිධ උගතුන් ඒ පිළිබඳ තම මතය ඉදිපත් කරයි. මෙම කරුණෙහිලා එකී වියතුන්ගේ මෙන්ම භේසජ්ජමඤ්ජුසාවෙහි සඳහන් තොරතුරුද විමසීම මෙහිලා උපයුක්තය. භේසජ්ජමඤ්ජුසාවෙහි කර්තෘ සහ කාලය පිළිබඳව එහිම සඳහන් වන්නේ මෙසේය.

සාකෙ පරක්කමබුජවහ - නරින්ද ජම්බු -

ද්දොණි පුරම්හි නිවසං ගජකුටසංඛෙ

බ්‍රහ්මන්වයෝ යතිරකාසි භිසක්කතන්තං

එතඤ්ච පඤ්චපරිවේණ සමූහ නාථො[13]

උක්ත පද්‍යයට අනුව භේසජ්ජඤ්ජුසාව රචනා කළ වර්ෂය ශක වර්ෂ වලින් දක්වා තිබේ. ලේඛන වර්ෂය වශයෙන් එහි සඳහන් වන්නේ ශක වර්ෂ 1183 (ගජකුට) යනුවෙනි. ක්‍රිස්තු වර්ෂයෙන් එය දක්වෙන්නේ 1261 වශයෙන් බව පොදු මතයයි.[14] මෙම මතය ජිනදාස ලියනගේ මහතාද පිළිගත් බැව් දක්නට ලැබේ. මෙකල හෙළදිව් රාජ්‍ය කරවූයේ පරාක්‍රමබාහු නරේන්ද්‍රයන් විසින් බවද එහිම සඳහන් වීම තරමක් දුරට නිවැරදිවම කාල නිර්ණයෙහිලා උපකාරීවේ. දඹදෙණිය රාජධානිය කොට රාජ්‍යය විමසූ මෙතුමානෝ විශිෂ්ට කවියෙකු බවද ග්‍රන්ථ කරණයෙහි නියලුනවුන්හට බොහෝසෙයින් උපකාරද අනුග්‍රහයද දැක්වූ බව අපි දනිමු. ''පරක්කමබුජවහ - නරින්ද ජම්බු - ද්දොණි පුරම්හි'' යන්නෙන් දඹදෙණියෙහි පරාක්‍රම රජ දවස ලෙස විද්‍යමාන වීමෙන් උක්ත ප්‍රකාශය තවදුරටත් විස්තරවේ. භේසජ්ජමඤ්ජුසාවේ 1-18 පරිච්ඡේද සංස්කරණය කළ ජිනදාස

ලියනගේ මහතාද මෙම අදහසම දරන බව උක්ත සංස්කරණයේ හැඳින්වීම විමසීමෙන් පෙනේ.[15] මේ අනුව භේසජ්ජමඤ්ජුසාව ලකදිව දඹදෙණි යුගයේ පරාක්‍රමබාහු රජ දවස ලියවිනි යැයි සිතීම නිවැරදිය.

කාල නිර්ණය මෙසේ වුවද භේසජ්ජමඤ්ජුසාව නම් කෘතියෙහි කර්තෘ පිළිබඳවද වියතුන් අතර පොදු අදහසක් නොමැති බවක් දක්නට ලැබේ. වියත්හු එකිනෙකට ප්‍රතිවිරුද්ධ අදහස් දරණ බවක් ඔවුන්ගේ අදහස් පිරික්ෂීමෙන් විද්‍යමාන වේ. අත්ථදස්සී නම් හිමි නමක විසින් මෙම අගනා ග්‍රන්ථය විරචිත බව ජී. පී. මලලසේකර මහතා පවසයි.[16] තව දුරටත් විස්තර සපයන එකී මහාචාර්යවරයාට අනුව සියනෑ කෝරලේ අත්තනගලු විහාරයේ වැඩ විසූ අත්ථදස්සී නම් හිමි නමක විසින් භේසජ්ජමඤ්ජුසාව රචනාකර ඇත.[17] මලලසේකර මහතා පවසන අන්දමට අත්ථදස්සී හිමියෝ පස් මුල් පරිවේනාධිපති ධූරයද හෙබවූ යෝගරත්නාකරය නම් කෘතියෙහිද කර්තෘය.[18] නමුදු මෙම අදහස තරමක් පිළිගැනීමට අපහසු බවත් මෙය නිවැරදිම විග්‍රහය නොවන බවත් ජිනදාස ලියනගේ මහතා තම සංස්කරණයේ හැඳින්වීමේදී සඳහන් කරයි.[19] වර්ෂ 1881 දී සිලෝන් සෙෂනල් පේපර් (Ceylon Sessional papers viii, 1881) හිදී ඩබ්. ආර්. කින්සි මහතගේ සාවද්‍ය ප්‍රකාශයක් මෙසේ මලලසේකරයන් ඇතුලු වියතුන් ගණනාවක්ම නොමග යාමට හේතුව බව ජිනදාස ලියනගේ මහතා දක්වයි.[20] මෙපමණකින් සෑහීමකට පත්නොවූ වියතුන් භේසජ්ජමඤ්ජුසාවේ කර්තෘත්වය පඤ්චමූල පරිවේනාධිපති මංගල සංඝරාජ මාහිමියන්ගේ බවද පැවසීමට උත්සුක වෙයි. විලේගොඩ ධර්මකීර්ති ශ්‍රී ධම්මානන්ද හිමියන් භේසජ්ජදඤ්ජුසා සන්නය සංස්කරණය කරමින් උක්ත අදහස ඉදිරිපත් තරන බවත් එහි කිසිඳු පදනමක් නොවන බවත් ජිනදාස ලියනගේ මහතගේ වැඩිදුරටත් පවසයි.[21] මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතාද සිය 'ආයුර්වේද අධ්‍යයනය' නම් කෘතියෙහිද භේසජ්ජමඤ්ජුසාව දඹදෙණි යුගයේ විසූ පඤ්චමූල පරිවේනාධිපති මංගල සංඝරාජ හිමියන් විසින් රචිත බව පවසයි.[22]

මෙසේ කර්තෘ පිළිබඳ විවිධ මතභේද ඇතිවීමට හේතු වශයෙන් දක්විය හැක්කේ භේසජ්ජමඤ්ජුසාවේ කර්තෘගේ නිල නාමයක් මිස පුද්ගල නාමයක් දක්නට නොලැබීමයි. ''The head

of the group of five monastic colleges'' ලෙස ජිනදාස ලියනගේ මහතා විසින් පරිවර්තිත ''පඤ්චපරිවේණ සමූහ නාථො'' යන පාඨය භේසජ්ජමඤ්ජුසාවේ කර්තෘවරයාගේ නිල නාමය දක්වයි. මෙම නාමය හුදු පැවිදි උතුමෙක් උදෙසාම භාවිත බව පැහැදිලි වන්නේ පිරිවෙන් පහක් හෙවත් පඤ්චපරිවේණ සමූහයක් පිළිබඳ පැවසීමෙන්ය. මන්ද යත් පිරිවෙනක් යනු භික්ෂූන් අධ්‍යාපනය ලබන ස්ථානයකි. භික්ෂූන්ට නායකත්වය සපයමින් පිරිවෙන් පහක අධිපතීත්වය දැරූ හිමිනමක විසින් භේසජ්ජමඤ්ජුසාව විරචිත බව සිතීම වඩාත් නිවැරදි මතයයි. පොල්වත්තේ බුද්ධදත්ත නායක හිමියන්ද තම පාලි සාහිත්‍ය නම් කෘතියෙහිද ''එය දඹදෙණි යුගයේ විසූ පඤ්චමූලපරිවේනාධිපති තෙරුන් විසින් විරචිතයි'' යනුවෙන් මෙම අදහසම දක්වා තිබේ.[23] මෙම හිමියන් බ්‍රාහ්මණ ජාතික හිමි නමක් බැව් ''බ්‍රහ්මන්වයෝ යතිරකාසි'' යන්නෙන් වැඩිදුරටත් පැහැදිළි වෙයි.

වෙදකම වනාහි ගර්හිත විද්‍යාවක් ලෙස ධර්මයෙහි විස්තර වුවද භේසජ්ජමඤ්ජුසාවේ කර්තෘ වනාහී කිසිඳු ලාභාපේක්ෂාවකින් තොරවම හුදු පරාර්ථය උදෙසාම විරචිත බව ග්‍රන්ථයෙහිම විද්‍යමානවේ.

අභිවාදිය සත්ථාරං මනෝරෝගතිකිච්චකං

සබ්‍රහ්මචාරිනෝ භික්ඛූ ජාතවෙය්‍යතතියාමුයා

කල්ලා හොන්තුති රෝගේසු අඤ්ඤමඤ්ඤතිකිච්ඡකා

සමුද්ධට්ඨපදතථෙහි පසතථෝනෙකකෝසතෝ

සම්පූරිතා භිසක්කානං හත්ථසාරවසූපමා

ඒසා භේසජ්ජමඤ්ජුසා කාරුඤ්ඤේනෝපනීයති[24]

'තම ග්‍රන්ථය පරිහරණයෙන් සබ්‍රහ්මචාරීන් අන්‍යොන්‍ය වශයෙන් නිරෝගී වේවා' යන්න උන්වහන්සේගේ පරම පවිත්‍ර අභිප්‍රාය බව උක්ත පද්‍යයෙන් විද්‍යමාන වේ. කිසිඳු ලාභාපේක්ෂාවකින් තොරව පරාර්ථ චේතනාවෙන්ම රචනාකරන ලද භේසජ්ජමඤ්ජුසා කතුවරයාගේ අරමුණ වන්නේ උක්ත කෘතිය රචනා කිරීමෙන් පින් රැස්කරගැනීම බවත් ඒ පිනෙන් නිවන් දක්නා ජාති දක්වාම ලෝ

සතුන් සැපවත් කිරීමට හැකිවේවායි උන්වහන්සේ වැඩිදුරටත් ප්‍රාර්ථනා නරන බව භේසජ්ජමඤ්ජුසාවෙහිම දක්නට ලැබේ.[25]

ඛ්‍යාතිසම්මානලාභාදි නිරපෙක්ඛේන කේවලං

ඉදං තන්තං පරත්ථාය රචයන්තේන යං මයා

සම්භතං කුසලං තේන ආසවානං ඛ්‍යාවධි

සබ්බාලෝකං සුඛයිතුං පභවෙය්‍ය භවේ භවේ[26]

එකල භාවිතයෙහි ප්‍රසිද්ධව පැවති ග්‍රන්ථ අශ්‍රයට ගනිමින් කතුවරයා විසින් මෙම කෘතිය රචනා කරන්නට ඇතැයි සිතිය හැකිය. දෙවනි පැරකුම්බාවන් විසින් බෞද්ධ ග්‍රන්ථ මෙන්ම වෙනත් විද්‍යාවන් පිළිබඳ ග්‍රන්ථ ලක්දිවට ගෙන්නවාගත් බව භේසජ්ජමඤ්ජුසා කතුවරයා එකී වෛද්‍ය ග්‍රන්ථ පරිශීලනය කරන්නට ඇතැයිද විශ්වාස කිරීමට තරම් සාධක භේසජ්ජමඤ්ජුසාවෙහිම ඇති බව ජිනදාස ලියනගේ මහතා පවසයි. අෂ්ටාංග සංග්‍රහය, සුශ්‍රැත සංහිතා, චරක සංහිතා, සිද්ධසාර, මාධව නිදාන, චක්‍රදත්ත සහ වංගසේන යන කෘතීන්හි ආභාෂය සෘජුවම භේසජ්ජමඤ්ජුසාව රචනයෙහිදී පාදක වන්නට ඇතැයි පවසන ලියනගේ මහතා පාලියට නැගුණු සංස්කෘත ශ්ලෝක බෙහෝමයක් පිළිබඳව එතුමගේ සංස්කරණයෙහි හැඳින්වීමෙහිදී දක්වා තිබේ.[27]

භේසජ්ජමඤ්ජුසාව වනාහි පරිච්ඡේද හැටකින් යුක්ත බව පැවසුනද ඒ පිළිබඳ තොරතුරු සපයාගැනීම උගහට වන්නේ භේසජ්ජමඤ්ජුසාවේ සම්පූර්ණ මුද්‍රිත පොත් සපයාගැනීම දුෂ්කර නිසාය. ක්‍රිස්තු වර්ෂ 1744 දී භේසජ්ජමඤ්ජුසාවට සන්නයක් ලියන වැලිවිට සරණංකර සංඝරාජයාණෝ මීට සිංහල ව්‍යාඛ්‍යාවක්ද සපයා ඇත. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ආරාධනයෙන් උක්ත සන්නය කළ බැව් පැවසෙන අතර එකී සන්නකරණයෙහිලා උනවහන්සේගේ ශිෂ්‍ය පිරිසගෙන්ද අනූපමේය සහයක් ලැබී ඇත. කතු කෙසේ වෙතත් මෙම ග්‍රන්ථය පරිච්ඡේද හැටකින් සහ ගාථා පන්දහසකට ආසන්න ප්‍රමාණයකින් යුක්ත බව පැවසේ. මෙය වනාහි සම්පූර්ණ වෛද්‍ය ග්‍රන්ථයකැයි පිළිගැනීමට වියත්හු මැලි නොවෙති.

පූර්වෝක්ත පරිච්ඡෙද හැට පහත පරිදි දැක්විය හැකිය.

1. උපතඤ්ඤාසවිධි
2. ද්‍රව්‍යරසාදිසංග්‍රහය
3. සදාචාරසංග්‍රහය
4. භාවී ආබාධ පටිසේධසංග්‍රහය
5. අන්නව්‍යඤ්ජනසංග්‍රහය
6. ද්‍රවද්‍රව්‍යසංග්‍රහය
7. සවිසාරසංග්‍රහය
8. ප්‍රතිවිෂසංග්‍රහය
9. ආමභේද සංග්‍රහය
10. ගණ සංග්‍රහය
11. මහාකර්ම සංග්‍රහය
12. චූලකර්ම සංග්‍රහය
13. දූතාරිෂ්ට සංග්‍රහය
14. ගමනාරෂ්ට සංග්‍රහය
15. ස්වප්නාරිෂ්ට සංග්‍රහය
16. උත්පාතාරිෂට සංග්‍රහය
17. රෝගාරිෂ්ට සංග්‍රහය
18. රෝගසාමාන්‍යවිධි සංග්‍රහය
19. ජ්වර සංග්‍රහය

20. ක්ෂයරෝග සංග්‍රහය
21. ස්වරභේද සංග්‍රහය
22. අරුචි සංග්‍රහය
23. හෘදයරෝග සංග්‍රහය
24. තෘෂ්ණා (පිපාසා) සංග්‍රහය
25. ඡර්දි සංග්‍රහය
26. කාශරෝග සංග්‍රහය
27. ශ්වාස සංග්‍රහය
28. හික්කා සංග්‍රහය
29. අතීසාර සංග්‍රහය
30. ග්‍රහණී සංග්‍රහය
31. දුර්නාම සංග්‍රහය
32. භගන්දර සංග්‍රහය
33. ප්‍රමේහ සංග්‍රහය
34. මුත්‍රාඝාත සංග්‍රහය
35. උපදංශ සංග්‍රහය
36. මුෂ්කරෝග සංග්‍රහය
37. රක්තපිත්ත සංග්‍රහය
38. ගුල්මරෝග සංග්‍රහය
39. උදාවර්ත සංග්‍රහය

40. උදරරෝග සංග්‍රහය
41. කාමිල (පාණ්ඩු) සංග්‍රහය
42. ශෝථරෝග සංග්‍රහය
43. විද්‍රධි සංග්‍රහය
44. විසර්ප සංග්‍රහය
45. කුෂ්ටරෝග සංග්‍රහය
46. කෘමිරෝග සංග්‍රහය
47. වාතරෝග සංග්‍රහය
48. ශෝණිත වාතරක්ත සංග්‍රහය
49. චක්ඛුරෝග සංග්‍රහය
50. සෝතරෝග සංග්‍රහය
51. සාණරෝග සංග්‍රහය
52. මුඛරෝග සංග්‍රහය
53. ශිරෝරෝග සංග්‍රහය
54. ගලගණ්ඩමාල සංග්‍රහය
55. ක්ෂුද්‍රරෝග සංග්‍රහය
56. වණභග්ග සංග්‍රහය
57. අපස්මාර යක්ෂභූතාදී සංග්‍රහය
58. විසප්පතිකාර සංග්‍රහය
59. කල්ප සංග්‍රහය
60. රසායන සංග්‍රහය[28]

මෙකී මාතෘකා අනුව විමසන කළ භේසජ්ජමඤ්ජුසාව වනාහි සම්පූර්ණ වෛද්‍ය ග්‍රන්ථයක් බව පැවසීම යුක්තියුක්තය.

කෙස් පැලීම වැනි සුලු රෝග කෙරෙහිද අතීසාරය, අංශභාගය වැනි අතිශය විපත්තිකර රෝග පිළිබඳවද කෙරෙන විග්‍රහය සර්වාංග වෙදකම පිළිබඳ තොරතුරු සපයන අතර ඇස් රෝග හදවත් රෝග වැනි සියුම් වූත් රෝග පිළිබඳව කෙරෙන විග්‍රහය වනාහි කතුවරයා සතු ආයුර්වේද දැනුම විදහාපායි. රෝග ලක්ෂණ රෝග කාරක පිළිබඳ පැහැදිළි විමසුමක් සිදුකරන කතුවරයා එකී රෝග වලට සිදු කළ යුතු ප්‍රතිකර්ම පිළිබඳ විග්‍රහයක්ද සිදුකරයි. සොබාදහමින් ලබාගන්නා ස්වාභාවික ද්‍රව්‍ය ඖෂධ වශයෙන් භාවිත කළ යුතු බව පවසන කතුවරයා ගස්වල පස්පංගුව භාවිතයට ගෙන සාදාගන්නා ඖෂධ පිළිබඳවද දක්වා තිබීම සොබාදහමින් වියුක්ත මිනිසුන් සොබාදහම සමග බද්ධ කිරීමය ගත් උත්සහයක් ලෙස අගය කළ හැකිමුත් සොබාදහමට අනුගතවූවෝ නිරෝගී මිනිසුන් බවත් ව්‍යංගව පවසන පණිවුඩයකි. තවද විවිධ ඖෂධ ප්‍රමාණාත්මකව ගෙන මිශ්‍ර කිරීමෙන් නව ඖෂධ වර්ග නිර්මාණය කරගන්නා අයුරු පැවසෙන භේසජ්ජමඤ්ජුසාව වනාහි විවිධ තෙල් වර්ග භාවිතය පිළිබඳවද උවදෙස් රාශියක් සපයයි. එළඟිතෙල්, වෙඬරු වැනි තෙල් වර්ග භාවිතයෙන් රෝග නිවාරණය කරන අයුරු දක්වන භේසජ්ජමඤ්ජුසාව මී පැණි, හූන මකුල්, මුහුදු පෙන යනාදිය බෙහෙතට යොදාගත් අයුරු දැක්වේ.[29]

ධර්මය හා දිවි ගෙවීම වනාහී නිරෝගී වීමේ පියවරක් බව භේසජ්ජමඤ්ජුසාවේ පැහැදිළිවම දක්වා තිබේ. වෛද්‍ය උපදෙස් ලබාදෙන ග්‍රන්ථයක් ලෙස ද භේසජ්ජමඤ්ජුසාවට අනුපමේය අගයක් හිමි වන්නේ මේ නිසායාය. මනෝ රෝග වූපසමනය උදෙසා වූ මෙම වටිනා උපදෙස් හුදු රෝග නිවාරණය උදෙසාම පමණක් නොවන බවද එකී උපදෙස් උභයාර්ථ සිද්ධිය සඳහාම වන බව පැවසීම මෙම කෘතියේ අගය තවතවත් වෘද්ධි කරවයි. මෙනයින් බලන කල භේසජ්ජමඤ්ජුසාව වනාහි පාලියෙන් රචිත සම්පූර්ණ වෛද්‍ය ග්‍රන්ථයකැයි පැවසීම සාධාරණය.

මීට අමතරව පාලියෙන් රචිත විවිධ වෛද්‍ය ග්‍රන්ථ පිළිබඳව අනුමානයන් කළ ද නිවැරදි තොරතුරු සැපයීම උගහටය. එසේ

හෙයින් වියතුන් විසින් භේසජ්ජමඤ්ජුසාවම පාලියෙන් හෙළදිවිහි රචිත එතම සහ විශිෂ්ටතම වෛද්‍ය ග්‍රන්ථය ලෙස පිළිගනී.

සමාලෝචනය

පාලියෙන් රචිත විශිෂ්ටතම වෛද්‍ය ග්‍රන්ථ පෙළක් ලෙස ත්‍රිපිටකය හැඳින්වීම සාධාරණ වන්නේ කායික සහ මානසික රෝග යන උභය රෝග නිවාරණය උදෙසාම උපදෙස් එහිලා සංගෘහිත හෙයිනි. හුදු ලෞකික පරමාර්ථයෙන් ඔබ්බෙහි වූ නිර්වාණාධිගමය පිණිස දුක නමැති රෝගයට ඖෂධ වට්ටෝරුවක් ලෙස ත්‍රිපිටකය භාවිතයෙන් නිසි එල ලැබිය හැකි බව නොරහසකි. ඉන් අනතුරුව අපට හමුවන විශිෂ්ට වූත් සම්පූර්ණ වූත් වෛද්‍ය ග්‍රන්ථය වන්නේ භේසජ්ජමඤ්ජුසාවයි. සකු ආභාෂය ලද මෙහි ඇති බොහෝ ඖෂධ සහ රෝග පිළිබඳ විග්‍රහට කෙනෙකුට තනිව කියවා තෙරුම්ගත හැකි අයුරින් තිබීම වනාහි මෙම කෘතියේ අගය වැඩි කරන්නකැයි පැවසීම නිවැරදිය. සර්ව සම්පූර්ණ වෛද්‍ය ග්‍රන්ථ අතුරුන් එකක් වන භේසජ්ජමඤ්ජුසාව පාලියෙන් රචිත එකම වෛද්‍ය ග්‍රන්ථය ලෙස සම්භාවනාවට පාත්‍ර වී හමාරය.

ආන්තික සටහන්

1. *සුශ්‍රැතසංහිතාව*, සූත්‍රස්ථානය, 1, 06, අනුවාදකඃ බුද්ධදාස, ආර්., කොළඹ, 964.
2. *චරකසංහිතාව*, සූත්‍රස්ථානය, 1. 15, අනුවාදකඃ බුද්ධදාස, ආර්., කොළඹ, 1960.
3. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ., *පාලි සාහිත්‍යය* (සම්පූර්ණ පොත), කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ, 2007, පිටු. 12.
4. *පාලි භාෂාව සහ මසධ භාෂාව යන භාෂා දෙකම එකක්ද යන්න තරමක් විවාදාපන්න කරුණක් නමුත් මෙහිදී පාලි යන පදයට සමාන අරුතින් යුතුව මසධ යන වචනය භාවිත බව දත යුතුය.
5. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ., *පාලි සාහිත්‍යය* (සම්පූර්ණ පොත), කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ, 2007, පිටු. 17.
6. ද්වේ මේ භික්ඛවේ රෝගා කථමේ ද්වේ? කායිකෝච රෝගෝ චේතසිකෝච රෝගෝ...

අංගුත්තර නිකාය, චතුක්ක නිපාතය, ඉන්ද්‍රිය වග්ගය, රෝග සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2005, පිටු. 276

7. දිස්සන්ති, භික්ඛවෙ, සත්තා කායිකෙන රොගෙන එකම්පි වස්සං ආරොග්‍යං පටිජානමානා, ද්වෙපි වස්සානි ආරොග්‍යං පටිජානමානා, තීණිපි වස්සානි ආරොග්‍යං පටිජානමානා, චත්තාරිපි වස්සානි ආරොග්‍යං පටිජානමානා, පඤ්චපි වස්සානි ආරොග්‍යං පටිජානමානා, දසපි වස්සානි ආරොග්‍යං පටිජානමානා, වීසතිපි වස්සානි ආරොග්‍යං පටිජානමානා, තිංසම්පි වස්සානි ආරොග්‍යං පටිජානමානා, චත්තාරීසම්පි වස්සානි ආරොග්‍යං පටිජානමානා, පඤ්ඤාසම්පි වස්සානි ආරොග්‍යං පටිජානමානා, වස්සසතම්පි, ආරොග්‍යං පටිජානමානා. තෙ, භික්ඛවෙ, සත්තා සුදුල්ලභා ලොකස්මිං යෙ චෙතසිකෙන රොගෙන මුහුත්තම්පි ආරොග්‍යං පටිජානන්ති, අඤ්ඤත්‍ර ඛීණාසවෙහි. අංගුත්තර නිකාය, *එම*, පිටු. 276

8. ආරෝග්‍ය පරමාලාභා - සන්තුට්ඨී පරමං ධනං

   විස්සාසා පරමා ඤාති - නිබ්බානං පරමං සුඛං ඛුද්දක නිකාය, *ධම්මපදපාළි*, සුඛවග්ගෝ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2005, පිටු. 76

9. පූතිමුත්තභෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා, තත්ථ තෙ යාවජීවං උස්සාහො කරණීයො; අතිරෙකලාභො - සප්පි, නවනීතං, තෙලං, මධු, ඵාණිතී'න්ති. විනය පිටකය, *මහාවග්ගය*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, 2005, පිටු. 126

10. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ., *පාලි සාහිත්‍යය* (සම්පූර්ණ පොත), කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ, 2007, පිටු. 508

11. Malalasekara G.P., *The Pāli literature of Cylon*, Colombo, D.M. Gunasen & co., LTD., 1958, p. 215

12. *Bhesajjamañjūsā*, (Chapters 1-18) Ed. Liyanage. Jinadasa., The Pali text society, Oxford, 1996, p. 01

13. - Ibid -

14. *සාරගවේසී*, (සංස්.) සිරි පදුම හිමි. තල්ගම්පල., පාලි හා බෞද්ධ අධ්‍යයන සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 2004, පිටු. 14

15. " In the Śake year one thousand one hundred and eighty three (1261 A.D.) when king Parakkama was reigning the city of Jambudoni (modern Dambadeniya)

Bhesajjamañjūsā, (Chapters 1-18) Ed. Liyanage. Jinadasa., The Pali text society, Oxford, 1996, p. 01

16. Malalasekara G.P., *The Pāli literature of Cylon*, Colombo, D.M. Gunasen & co., LTD., 1958, p. 215
17. ATTHADASSI (3), author of the Bhesajja Manñjusa, a medical work in Pali stanzas. He is said to have resided in the Attanagalu -vihara in Siyanii Korale about the year 1207 A. C. in the reign of Parākramabāhu II… *Encyclopedia of Buddhism Vol*. 2, Ed. G.P. Malalasekara, Government of Cylon, 1966, p. 333
18. In a Sinhalese medical work, Yoga-ratnākara,· compiled about the end of the fourteenth century, a verse in the colophon states that that work was arranged on the plan, "of the Mañjusa, a medical work in Pili stanzas, composed by Atthadassi Thera about the year A.D. 1267." If this information be correct, the author is undoubtedly our Panca-miila.-parive:r;ta-Adhipati.. Malalasekara G.P., *The Pāli literature of Cylon*, Colombo, D.M. Gunasen & co., LTD., 1958, p. 215
19. *Bhesajjamañjūsā*, (Chapters 1-18) Ed. Liyanage. Jinadasa., The Pali text society, Oxford, 1996, p. 03-04
20. - Ibid -
21. - Ibid – p.03
22. ගල්මංගොඩ, සුමනපාල., *ආයුර්වේද අධ්‍යයන*, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආතනය, යක්කල, 2003, පිටු. 68-69
23. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ., *පාලි සාහිත්‍යය* (සම්පූර්ණ පොත), කොළඹ, රත්න පොත් ප්‍රකාශකයෝ, 2007, පිටු. 508
24. *Bhesajjamañjūsā*, (Chapters 1-18) Ed. Liyanage. Jinadasa., The Pali text society, Oxford, 1996, p. 40
25. “Without expecting material gain such as fame and distinctions, but solely for the benefit of others, with the hope that thanks to the merit thus acquired, he may be able to bring happiness to all beings in his future existences until he reaches Nibbāna” - Ibid - p. 01

26. - Ibid - p. 02

27. - Ibid – p. 22

27. ගල්මංගොඩ, සුමනපාල., *ආයුර්වේද අධ්‍යයන*, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආතනය, යක්කල, 2003, පිටු. 69-71

29. *සාරගවේසී*, (සංස්.) සිරි පදුම හිමි. තල්ගම්පල., පාලි හා බෞද්ධ අධ්‍යයන සංගමය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 2004, පිටු. 19